# 'පට්ඨාන' ධර්ම දේශනා මාලාව
# 'වීථි වාර - අධිපති ප්‍රත්‍යය'
# 17. 05. 2018

නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස
නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස
නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස

තුන් ලෝකාග්‍ර වූ භාග්‍යවත් වූ අරිහත් වූ සර්වඥ ධර්මරාජයාණන් වහන්සේට සත්වයන් කෙරෙහි අසීමිත කරුණාවක් දයාවක් පළමුකොටම උපදවාගෙන සංසාරයේ නොයෙක් ගැහැට සන්තෝසයෙන් මගහරිමින් විඳ දරා ගනිමින් සත්ව කරුණාව මත පාරමී ධර්මයන් සර්ව ප්‍රකාරයෙන්ම පූර්ණය කොට තමන් වහන්සේ හුදකලාවම ජයශ්‍රී මහා බෝධීන් වහන්සේ අබියස වැඩ ඉඳගෙන සියලුම ධර්මයන් ප්‍රත්‍යක්ෂව අවබෝධ කරගනිමින් ලොව්තුරා බුදුබවට පත් උනා. සර්වඥතාඥාණයට පත් උනා. ඒ ශාන්ති නායක සම්මා සම්බුදුරජාණන්වහන්සේට මහා කරුණාවෙන් ධර්ම දේශනා කරමින් චතුරාර්ය සත්‍යය ධර්මයන් අවබෝධ කරවන්න උත්සාහ දැරූ ශාන්තිනායක ධර්ම රාජයාණන්වහන්සේට මම සිරසින් වැඳ නමස්කාර කරනවා, මාගේ නමස්කාරය වේවා!

ඒ අනන්ත ගුණ ඇති සම්මා සම්බුදුපියාණන් වහන්සේගේ සන්තානයෙන් දැක වදාළ උන්වහන්සේට පිහිට උනාවූ ලෝකයාට පිහිට උනාවූ ඒ උතුම් වූ ශ්‍රී සද්ධර්ම ස්කන්ධයට ධර්ම රත්නයට මම සිරසින් වැඳ නමස්කාර කරනවා. මාගේ නමස්කාරය වේවා!

ඒ උතුම් ධර්ම මාර්ගයේ ගමන්කොට නිර්වාණ ධාතුවට පැමිණියා වූ ආර්ය ගුණයෙහි පිහිටියා වූ ස්වාක්ඛාත ආදී ගුණයන්ගෙන් යුක්ත වූ ධර්මය අනුගමනය කොට ආහුනෙය්‍යා පාහුණෙය්‍යා භාවයට පත් උනාවූ අනන්ත ගුණ ඇති මහා සංඝරත්නයට මම සිරසින් වැඳ නමස්කාර කරනවා, මාගේ නමස්කාරය වේවා!

උතුම් වූ බුද්ධරත්නයේ අනුභාව බලයෙන් ධර්මරත්නයේ ආනුභාව බලයෙන් සංඝ රත්නයේ ආනුභාව බලයෙන් තුනුරුවන් ගැන සිතීම නිසා වැඳීම නිසා පහළ වෙන්නා වූ අනන්ත අප්‍රමාණ ගුණ ඇති කුසල චේතනාවන්ගේ ආනුභාව බලයෙන් ඒවගේම මේ පින්වතුන් මේ මොහොත දක්වාම වඩා දියුණු කරගත්තා වූ සීල සමාධි ප්‍රඥා ගුණයන්ගේ අනුභාව බලයෙන් සැම දෙනාටම අදත් ඉදිරිපත් වෙලා තිබෙන්නාවූ කාලය තුල කියලා දෙන්න බලාපොරොත්තු වෙන්නා වූ ධර්ම කොට්ඨාශය ඉතාමත්ම හොඳින් තේරුම් ගන්න ලැබේවා! වැටහේවා! අවබෝධ වේවා! ඒ සඳහා කිසිම බාධකයක් අපහසුවක් ආධ්‍යාත්මික වශයෙන් හෝ බාහිර වශයෙන් ඇති නොවේවා! මේ ධර්ම කරුණු ටික තේරුම් අරගෙන සැම දෙනාටම ප්‍රතිපදාවක් හැටියට මේ ධර්ම මාර්ගයේ ගමන්කොට අමාමහ නිවනින්

සැනසෙන්න ලැබේවා! කියලා පළමුකොටම මෛත්‍රීයෙන් ප්‍රාර්ථනා කරනවා. ආශිර්වාද කරනවා.

අද මම මේ පින්වතුන්ට අපි මීට ඉස්සරවෙලා කියලා දීපු ධර්ම කාරණයක විස්තරාත්මක කොටියාසයක් මතක් කරන්න සූදානම් වෙනවා. අපි දැන් මේ ප්‍රත්‍යය ධර්ම 24 පිළිබඳව කථා කිරීමේදී වීථි හැසිරෙන ස්වභාවය තමයි දිගටම කියමින් යන්නේ. තුන්වෙනි ප්‍රත්‍යය ධර්ම විභාගය තමයි **අධිපති ප්‍රත්‍යය** කියලා කියන්නේ. අපි ඉගෙන ගත්තා අධිපති ප්‍රත්‍යය කියලා ප්‍රත්‍යයයක්. මේ පින්වතුන් ඒ කථාව ඒ දේශනාව මීට කලින් අහල තිබෙන්න පුළුවන්. ඒ දේශනාව අද කෙනෙකුට අලුත් වෙන්නත් පුළුවන්. ඒ උනත් අපි මේ වෙලාවට මේ වචනයයි ප්‍රත්‍යයයයි කියන බෙදීම පිළිබඳව හිතාගෙන තේරුම් අරගෙන වීථි පිළිබඳව කථා කරන්න යමු.

බාහිර ලෝකයේ තිබෙන්නා වූ වස්තු වල ගස් කොළං ඒවගේම කඳු යායවල් පර්වත ගංගාවල් ආදී සෑම දේකම තිබෙනවා ප්‍රධානත්වයෙන් සලකන්නා වූ යම් යම් දේවල්. දැන් අපි ලංකාව ගත්තොත් ලංකාවේ තිබෙන ගංගාවල් වල තිබෙනවා ප්‍රධාන ගංගාවල්. කඳු ගත්තහම ප්‍රධාන කඳු තිබෙනවා. ඔස්ට්‍රේලියාවෙත් තිබෙනවා නවසීලන්තයේත් තිබෙනවා. එතකොට ඔය වගේ ප්‍රධාන ප්‍රධාන ඒවා තිබෙනවා. ඒවගේම යම් කිසි ශක්තියක් වැඩියෙන් තිබෙන්නාවූ දේවල් තිබෙනවා. යම් කිසි නාම ධර්මයක් හෝ වේවා රූප ධර්ම සමූහයක් හෝ වේවා අපි අරගෙන සලකන කොට ඒ ධර්ම වල තිබෙනවා වැඩි බලයක් වැඩි ශක්තියක් වැඩි හයියක් තිබෙන්නාවූ දේවල්. ඒ වැඩි බලයක් තිබෙන වැඩි හයියක් වැඩි ශක්තියක් තිබෙන්නාවූ දේවල් එහෙම කියන්නේ ඒවාගේ තිබෙන බලය නිසා ඒවාගේ තිබෙන ශක්තිය හැකියාව නිසා ඒවාට පුළුවන් කම තිබෙනවා අනිත් ධර්ම ටික තමාට නතු කරගෙන තමාට අවනත කරගෙන තමාට යටත් කරගෙන තමාව එතැන ඉස්මතුවෙලා ඒවාගේම බලවත් වෙලා ක්‍රියාත්මක වෙන්න. ආන්න එහෙම අනිත් අයගේ සැලකිල්ල අනිත් ධර්ම වල තිබෙන්නාවූ ගරුකිරීම ලබාගෙන පවතින්නාවූ ධර්ම වලට කියනවා **අධිපති ධර්ම** කියලා. එක ධර්මයක් අධිපති වෙන්නේ නෑ. අධිපති කමක් දරන්න නම් එකට වැඩි ධර්ම සමූහයක් තිබෙන්න ඕනෑ. එහෙම සමූහයක තමයි යම් කිසි දෙයක් යම් කිසි කෙනෙක් ප්‍රධානතත්වයක් අධිපති කමක් දරන්නේ.

ඔය වගේ යම් කිසි තැනක ධර්මයක් ප්‍රධාන නම් ඒ ප්‍රධානකම නිසා අනිත් ඒවා ඒකට අනුකූලව ඒකට අනුයාත වෙලා කීකරු භාවයෙන් ක්‍රියාත්මක වෙන්න සිද්ධ වෙනවා. මේකේ ධර්මතා දෙකක් තිබෙනවා. එකක් තමයි බලවත් වූ අධිපති ධර්මය. අනිත් එක තමයි අධිපති ධර්මයට යටත් වන්නා වූ දුබල වන්නා වූ ඒවාගේම ක්‍රියා කරන්නා වූ ධර්මය කියනඑක. එතකොට ධර්මතා දෙකක් තිබෙනවා. එකක් ධර්ම සමූහයක් අනුයාත කරගැනීමේ හැකියාව තිබෙන ධර්මය. අනිත් එක තමයි අනුයාත වෙලා ක්‍රියාත්මක වෙන ධර්මය. මේ අධිපති ධර්ම වල තිබෙනවා එක ධර්මයක් අධිපති වෙනකොට ඒක තමයි අධිපති ධර්මය. ඇයි ඒක අධිපති භාවයට පත්වෙන්නේ? එහෙම හැකියාවක් ඒක අස්සේ තිබෙන නිසා. එහෙම ධර්ම ස්වභාවයක් නැත්නම් එහෙම අධිපති වෙන්නේ නෑ. එතකොට අනිත් ධර්ම මේ අධිපති භාවය තිබෙන ධර්මයට අනුකූලවය ක්‍රියාත්මක වෙන්න ඕනෑ වෙන්නේ ඒවාට ඒ හැකියාව නැති නිසා. ඒක නිසා කියනවා **ප්‍රත්‍යය ධර්ම** සහ **ප්‍රත්‍යය**

**උප්පන්න** ධර්ම කියලා. මෙතැන අපි කථා කරන්නේ අධිපති ප්‍රත්‍යය ශක්තිය තිබෙන ධර්මය ගැන. මේ අධිපති ධර්මය මතක ඇති අපි මීට කලින් ආකාර දෙකකට කථා කළා. ඒ දෙවිදිය තමයි ඒ ධර්මය ආරම්මණයක් වශයෙන් ඉදිරිපත් වෙලා අධිපති වෙනවා. බලවත් වෙනවා. සමහර වෙලාවට එකට උපදින්නා වූ පිරිසක අධිපතියා වෙනවා. ඒකට කියනවා **සහජාත** වශයෙන් අධිපතියා වෙනවා කියලා. **ආරම්මණයක්** හැටියට අධිපති වෙනවා **සහජාත** හැටියට අධිපති වෙනවා. ආරම්මණයක් හැටියට අධිපති වෙනවා කියලා කියන්නේ අපේ ඇහැට කනට නාසයට දිවට ශරීරයට අරමුණු එනවා. සිතටත් අරමුණු එනවා. ඒ අරමුණු එනකොට සමහර අරමුණු නිකං එන්නේ නෑ. සමහර අරමුණු හයිය වැඩි නිසා අරමුණු වල තිබෙන බලවත් කම නිසා ඒවායේ තිබෙන අධිපති කම නිසා මහා බල ශක්තිය නිසා ඇහැ අහකට හරවන්න බෑ. හිතෙන්නේ නෑ. කන අහකට ගන්න බෑ. ආරම්මණය හරි සැරයි බරයි. අධිපතියි. ඒවාගේම නාසය දිව ශරීරය අහකට ගන්න බෑ. හිත නවත්වන්න බෑ. හිත ඒකෙම රැඳිලා ඉන්නවා. ඒ අරමුණේ තිබෙනවා මහා බලවත් බවක්. මහා ගැම්මක් ඇති බවක්. මහා හයිය බවක්. සමහර අයගේ හිත් වලට එක එක දේවල් හොඳ වශයෙන් හෝ නරක වශයෙන් ඇති උනහම ඒවා අමතක කරන්න බැරි වෙන්නේ ඔය ආරම්මණ වශයෙන් එන එකේ අධිපතිබව හයිය බව ගොඩක් තිබෙන නිසා. ඒක නිසා ඒවාට කියනවා **ආරම්මණ අධිපති** වෙනවා කියලා.

අනිත් එක තමයි සිතේ ඇතිවෙන සිතුවිලි සහ චෛතසික ධර්ම වලට ක්‍රියාත්මක වෙන්න තමයි අර බාහිර අරමුණක් බලවත් වෙන්නේ. එතකොට මේ චිත්ත චෛතසික ධර්මයෝ ඔක්කෝම වැඩ කරන්නේ ඒ පැත්තට හැරිලා බරවෙලා. ආරම්මණය ඒ තරම්ම බරයි. නමුත් තව එකක් තිබෙනවා චිත්ත චෛතසික ධර්ම වල අස්සේ තිබෙනවා ධර්මතා කීපයක්. ඒවාට කියනවා සහජාත ධර්ම කියලා. ඒවත් අධිපති ධර්මය හැටියට කථා කරනවා. ඒවාට කියනවා සහජාත අධිපති ධර්ම කියලා. ඒකට උපදින අධිපති ධර්ම කියලා. ඔය වගේ ධර්මතා දෙකක් තිබෙනවා. අද අපි කථා කරන්නේ ඒ ධර්ම **ආරම්මණ අධිපති වශයෙන්** එන ධර්ම වල අධිපති භාවයට පත්වෙන ස්ථානවල චිත්ත වීථි වැඩ කරන විදිය පිළිබඳව ධර්ම හැදින්වීමක්.

පට්ඨානයේ විස්තර කරන තැන මෙන්න මෙහෙම වාක්‍යයක් ගැලපිලා යනවා.

1) පළවෙනි වෙනි වීථිය

**කුසලො ධම්මො කුසලස්ස ධම්මස්ස අධිපතිපච්චයෙන පච්චයො ආරම්මණාධිපති, සහජාතාධිපති** = කුසල ධර්මයක් කුසල ධර්මයකට ‘අධිපති ස්වභාවයෙන්’ ‘අධිපති ප්‍රත්‍යයයෙන්’ ප්‍රත්‍යය වෙනවා.

මෙහි ආකාර දෙකක් වෙනවා. **ආරම්මණ අධිපති** ප්‍රත්‍යයයෙනුත් ප්‍රත්‍යය වෙනවා. **සහජාත අධිපති** ප්‍රත්‍යයයෙනුත් ප්‍රත්‍යය වෙනවා. මේක තමයි පළවෙනි වීථිය. එතකොට අපි බලමු මේක වෙන්නේ කොහොමද කියලා. ඉස්සෙල්ලා බලමු ආරම්මණයක් හැටියට මේක වෙන විදිය.

- **දානං දත්වා සීලං සමාදියිත්වා උපොසථකම්මං කත්වා, තං ගරුං කත්වා පච්චවෙක්ඛති**

අපි නිතර සිදු කරන පුංචි කාලේ ඉඳලාම හුරු කරලා තිබෙන ඒවගේම විශේෂිත කටයුතු තුනක් මෙතැන ඉදිරිපත් වෙනවා. **දානං දත්වා =** දානය දීම. මලක් පහනක් පූජා කිරීම සීලයක් සමාදන් වීම සුවඳ ධූපයක් පූජා කිරීම ආහාර පාන දීම වස්ත්‍ර ආදිය දීමත් දාන තමයි. හොඳ හිතින් හයියට දීපු දානයක් හෝ පන්සිල් අටසිල් ආදී වශයෙන් සීලයක් සමාදන් වෙලා හෝ එහෙම නැත්නම් උපෝසථ කර්මයක් කරලා හෝ (උපෝසථ කර්මය කියන්නේ පොහොය දවසට සීල අධිෂ්ඨානයක් කරලා එම දවස ගත කිරීම) ඊට පස්සේ **- තං ගරුං කත්වා පච්චවෙක්ඛති** = ඒ තමන් කරපු දේට හොඳට වටිනාකමක් අගයක් දීලා හොඳට හිතනවා මෙනෙහි කරනවා. වන්දනා ගමනක් ගිහිල්ලා හරි භාවනාවකට ගිහිල්ලා හරි ඒ කරපු දේ හොඳට මෙනෙහි කරනවා. ඒකට කියනවා ප්‍රත්‍යයවේක්ෂා කරනවා කියලා. කරපු දේ කරපු විදිය දීපු දේ දීපු විදිය හොඳට මෙනෙහි කරනවා. ඒ මෙනෙහි කරන වෙලාවේදී මෙනෙහි කරන කුසල් සිත් ටික පහළ වෙන්නේ පස්සේ. ඒ ප්‍රත්‍යයවේක්ෂා කරන්නා වූ කුසල සිත් වලට අරමුණුවෙන දේ සිද්ධ වෙලා තිබෙන්නේ ඊට කලියෙන්. ඒක අතීතයි. දානය දීම සිල් රැකීම උපෝසථ කර්මය වගේ දේවල් අතීතයි. අතීත උනත් ගරුසම්භාවණීය පූජණීය අරමුණක් තිබෙනවා. ඒ අරමුණ පැත්තට හැරිච්ච යොමුවෙච්ච චිත්ත චෛතසික ටිකක් මේ වෙලාවේදී මෙනෙහි කිරීම් වශයෙන් ක්‍රියාත්මක වෙනවා.

දැන් මෙතනදී දානය දීලා සිල් රැකලා උපෝසථ කර්මය කරලා තිබෙන ඒ අරමුණේ තිබෙනවා මහා බලයක්, මහා අධිපති ශක්තියක් තිබෙනවා. පස්සේ පස්සේ පහළ වෙන සිතුවිලි ටික ඒ අරමුණ පැත්තට හරවාගෙන නම්මාගෙන ඒවාගේම යොමු කරවාගෙන ඒ හිත්වලට ආරම්මණ අධිපති භාවයෙන් ලොක්කෙක් වගේ මේ හිතට වෙන මොකක්වත් හිතන්න නොදී ඒ ගැනම හිත්වන්න පුළුවන් ගතියක් ඒ පරණ කරපු ඒවා වල තිබෙනවා. ඒකට කියනවා ආරම්මණයක් හැටියට ආරම්මණ ප්‍රත්‍යය ශක්තිය ඇවිල්ලා කුසල ධර්මයන්ට ආරම්මණ අධිපති භාවයෙන් ප්‍රත්‍යය වෙනවා කියලා.

දැන් මෙතන **පච්චවෙක්ඛති** කියලා කියන තැන තිබෙන්නේ හොඳ සිත්. කුසල් සිත් තිබෙනවා අකුසල් සිත් තිබෙනවා. විපාක සිත් තිබෙනවා. දැන් මෙතැන පහළ වෙන්නේ හොඳ දෙයක් අරමුණු කරගෙන හොඳ දෙයක් හිත හිතා හොඳ පැත්තකට හැරිච්ච හොඳ පිරිසිදු ප්‍රත්‍යයවේක්ෂා කුසල් සිත්. මේවා කුසල ධර්මයන්. එතකොට ඉස්සෙල්ලා කරපු පිං කම් ටික ඒ කුසල ආරම්මණය මේ වෙලාවේ පහළ වෙන හිත් වලට චෛතසිකයන්ට ආරම්මණ අධිපති ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙනවා කියන එක තමයි පැහැදිලි වෙන්නේ. මෙහෙම ධර්ම ස්වභාවයක් තිබෙනවා.

තවත් එකක් තිබෙනවා. සමහර වෙලාවට මිනුස්සුන්ට ඔය කුසල් කරාට ඒවා මතක හිටින්නේ නෑ. සාමාන්‍යයෙන් සිද්ධ කරන දානමාන පින්කම් ඒ තරම් මතක හිටින්නේ නෑ. මතක හිටින්නේ නැති හේතුවක් තිබෙනවා. ඒවා ඒ තරම් ඕනෑ කමකින් ගරු කිරීමකින් හැඟීමකින් හිතට බලය දාල හිතෙන් ශක්තියක් ඒකට දාල කර්මය කර්ම ඵලය අදහාගෙන විස්වාස කරගෙන කරලා නෑ. ඒවගේම බුද්ධ සාසනයට ගරුකම් දීලා කරලා නෑ. ඒක නිසා ගොඩක් අයට ඒවා හිතෙන්නේ නෑ. නමුත් යම් කිසි වේලාවක කෙනෙක් පිරිසක් එක්ක හෝ තනියම යම් කිසි දෙයක් ඉතාමත්ම උසස් හැඟීමකින් සිද්ධ කළොත් ඒක හරියට

ගලේ කොටපු සටහනටත් වඩා හයියට හිතේ හොඳට කැවෙනවා. එතකොට ඒ වගේ එකක් තමයි පස්සේ හිතන්න පුළුවන් වෙන විදියට අධිපති ප්‍රත්‍යය භාවයෙන් එන්නේ.

හොඳ දෙයක් කළහම ඒ කුසලය මෙනෙහි කරනකොට මෙන්න මෙහෙම සිද්ධියක් වෙනවා. මේ සිද්ධිය වෙන්නේ පස්සේ. දැන් මේ හිතේ යම්කිසි භවාංග පේළියක් යනවා. ඒ භවාංග පේළියක මැද්දැවකට තමයි මතකය කඩාගෙන එන්නේ. එතකොට වෙන්නේ භවාංගය කැඩිලා භවංග චලනය වෙලා භවංග උපච්ඡේද වෙලා ඊට පස්සේ මනෝද්වාරාවජ්ජනයක් යනවා. මනෝද්වාරාවජ්ජනයක් ඇති උනාට පස්සේ මහා කාමාවචර කුසල් සිත් වලින් එකක් ඒ වෙලාවට ජවනයක් හැටියට වාර හතක් යනවා. වාර හතක් විතර ගිහිල්ලා නැවත ඒක භවාංග වෙනවා. චිත්ත වීථිය ඉවරයි. නමුත් එක චිත්ත වීථියකින්ම අර පරණ කරපු එකක්වත් මතක කරන්න බෑ. මේවගේ සිත් පේළි ගොඩක් එන්න ඕනෑ. මේ හැම මනොද්වරික සිත් පෙළකටම පෙනෙන්නේ අර ඉස්සරවෙලා කරපු හොඳ දේ. එතකොට මෙතැන තමයි මේ චිත්ත වීථි ටික යන්නේ. ඒවාට කියනවා ප්‍රත්‍යයවේක්ෂණ චිත්ත වීථි කියලා. මේවා හොඳ චිත්ත වීථි. හොඳ කුසල්. එතකොට ඒ හොඳ කුසල් චිත්ත වීථි වලට හරියට බලවත් වෙන්නේ අධිපති වෙන්නේ අර ඉස්සෙල්ලා කරපු දේ. මේ එක විදියක්.

අපේ පින්වතුන් මේක හොඳට තේරුම් ගන්න ඕනෑ. එතකොට හරි ලේසියි පින්කමක් හෝ චේවා භාවනාවක් හෝ චේවා කළාට පස්සේ ඒ ගැන නැවත නැවත හිත හිතා මේ කුසල් සිත් පේළි යන හැටි තමන්ට මෙනෙහි කරගන්න පුළුවන්.

තව එකක් තිබෙනවා. ඒතමයි

- **පුබ්බෙ සුචිණ්ණානි ගරුං කත්වා පච්චවෙක්ඛති**

තමන් දැන් මේ ඉන්න මොහොතට කලින්සිද්ධ කරලා තිබෙන්නා වූ හොඳ දේවල් තිබෙනවා. අපි ඉසෙල්ලා කිව්වා වගේ වන්දනා ගමනක් වැඩි හිටියෙකුට සැලකීමක් අසරණයෙකුට පිහිට වීමක් වගේ දේවල් හොඳ හිතින් තමයි කරන්නේ. **පුබ්බෙ සුචිණ්ණානි** = පළමුවෙන් කරපු හොඳ දේවල් පස්සේ නැවත ගරු කරනවා. මෙනෙහි කරනවා. එතකොට සිද්ධ වෙන්නෙත් **කුසලො ධම්මො කුසලස්ස ධම්මස්ස අධිපතිපච්චයෙන පච්චයො** කියන එකයි.

තව එකක් මේ පින්වතුන් මෙහෙම තේරුම් ගන්න. 'ආරම්මණ ප්‍රත්‍යයයි' 'ආරම්මණ අධිපති ප්‍රත්‍යයයි' කියන්නේ දෙකක්. දැන් මේ කියන්නේ ආරම්මණ අධිපත්තිය ප්‍රත්‍යය ස්වභාවය. මේ වේලාවේ පහළ වෙන්නා වූ සිතුවිලි පේළිය කුසලයි. මේ කුසල් ටික ප්‍රත්‍යය උප්පන්නයි. මේවාට නිකම්ම පහළ වෙන්න බෑ. මේවා පහළ වෙන්නේ අර ඉස්සරවෙලා කරපු පිංකම් වල තිබෙනවා මේ වෙලාවට තිබෙන සිතුවිලි ටික පෙර කළාවූ හොඳ දේවල් ගරු කරලා උසස් කරලා මහත් තත්වයේ දාලා සලකනවා හිතනවා මෙනෙහි කරනවා = **පුබ්බෙ සුචිණ්ණානි ගරුං කත්වා පච්චවෙක්ඛති.** එතකොට වෙන්නෙත් **කුසලො ධම්මො කුසලස්ස ධම්මස්ස අධිපතිපච්චයෙන පච්චයො** කියන එක. මෙතැනත් අධිපති භාවයෙන් ක්‍රියාත්මක වෙනවා සහ වැඩ කරනවා. දැන් මේ විදියට ගත්තහම සුචින්න කර්ම කියලා

කියන්නේ හොඳ දේවල්. දාන සීල භාවනා වන්දනා මව් පිය උපස්ථාන සංඝ උපස්ථාන වත්පිළිවෙත් ඊළඟට ඔය පොඩි ළමයින්ට උදව් උපකාර කරන ඒවා වගේ ගොඩක් දේවල් මේකට දාන්න පුළුවන්. මොනවා හෝ වේවා සිත යොදලා හොඳ කර්මයක් හොඳ ක්‍රියාවක් හැටියට කරපු දේ තමන්ට මේ විදියට අධිපති ප්‍රත්‍යයෙන් ඉදිරිපත් වෙනවා, ප්‍රත්‍යය වේක්ෂණය කරන්න පුළුවන්. මේ ටික මෙතැනට එනකොට මහා කුසල් සිත් වලට තමයි බලපාන්නේ.

තව එකක් තිබෙනවා. ඒ කාරණය මෙහෙමයි.

- **ඣානා වුට්ඨහිත්වා ඣානං ගරුං කත්වා පච්චවෙක්ඛති**

**ඣානා වුට්ඨහිත්වා** = ධ්‍යානයෙන් නැගිටලා. මහන්සියෙන් මහන්සියෙන් කෙනෙක් බුදුගුණ හරි මෛත්‍රිය හරි හොඳට වඩපු ඒ භාවනාවක ඒකාග්‍රතාවය හරියට තිබෙනවා. චිත්ත සමාධිය සිතේ බැබලීම හිතේ ආලෝකමත් ගතිය හිතේ පැතිරිච්ච ගතිය හිතේ ලොකුබව ආරම්මණයේ ලොකුබව හොඳට ලොකුවට පැහැදිලිව ශාන්තව පිරිසිදුව ඒ සමාධි ආරම්මණය ඉදිරිපත් වෙනවා. දැන් ඒ විදියට ධ්‍යානයකට බැසගෙන ධ්‍යානයකට නැමීගෙන ධ්‍යානය හිතින් ස්පර්ශ කරගෙන ධ්‍යාන සැපයෙන් ධ්‍යාන සන්තෝසයෙන් ධ්‍යානය විඳ විඳ හිටපු හිත පස්සේ එළියට එනවා. ඒකට කියනවා ධ්‍යානයෙන් නැගිට්ටා කියලා. හැබැයි ඒ හිත ධ්‍යානය ගරුකරගෙන හිටියා. දැන් ඒ ධ්‍යානයෙන් නැගිට්ටත් ධ්‍යානයෙන් එළියට ආපු හිතට ඒ අතීතයට ගියා වූ ධ්‍යානයේ වටිනා කමක් තිබෙනවා. පස්සේ ඒ ධ්‍යානය ගැන හිතනවා මෙනෙහි කරනවා. ධ්‍යානයේ තිබුණ බැබලෙන ගතිය ශාන්ත ගතිය ආලෝකමත් ගතිය විස්තර වෙලා තිබ්ච්ච ගතිය ඔක්කොම මෙනෙහි කරනවා. මෙනෙහි කරනකොට තිබෙන්නේ ධ්‍යාන සිතුවිලි නොවෙයි. මෙනෙහි කරනකොට තිබෙන්නේ හොඳ කාමාවචර පිරිසිදු සිතුවිලි. මේ සිත් ටික පහළ වෙන්නේ කලින් පහළ වෙලා අතීතය පැත්තට ගිය ඒ ධ්‍යානය පැත්තට හැරිලා. ඒ ආරම්මණය අතීතයට ගියත් ඒ අතීත ආරම්මණයේ තිබෙනවා පුදුම හැකියාවක් පුදුම බලයක් අධිපති ශක්තියක් මේ සිත් ටික ඒ පැත්තට නම්මාගෙන හරවාගෙන හිතවන්න. ඒ පරණ සිතුවිලි වලට කියනවා අධිපති ශක්තිය තිබෙන ධ්‍යාන කියලා. එතකොට එතැනත් තිබෙන්නේ **කුසලො ධම්මො කුසලස්ස ධම්මස්ස අධිපතිපච්චයෙන පච්චයො** කියන අධිපති ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වීම.

මේක පටලවා ගන්න හොඳ නෑ. ධ්‍යානය කියන්නේ මහග්ගත භාවයට ගිය මහත් භාවයට ගිය උසස් භාවයට ගිය සිතුවිලි. ඒවා සාමාන්‍යයෙන් කාමාවචර සිතුවිලි නොවෙයි. ඒවා ලොකු බලවත් හයිය තිබෙන ඒවා. ඒවායේ චිත්ත ඒකාග්‍රතාවය හරි වැඩියි. නමුත් ඒවා පැත්තට හැරිලා වැඩ කරන සිත් මහග්ගත සිත් නොවෙයි. ඒවා කාමවචර කුසල් සිත්. මේ කුසල් සිත්ටික ඒ පැත්තට හරවා ගන්න හයිය ගතිය මහග්ගත කුසල් සිත් වල තිබෙනවා.

ඒ ගතිය අපේ ප්‍රායෝගික මට්ටමෙන් හිතන මෙනෙහි කරන හැටියට එහෙම තිබෙන එක හොඳයි. එහෙම තිබෙන නිසා තමයි අපිට යමක් කළහම භාවනාවට වාඩි උනහම ඒක ඉවර උනත් මෙනෙහි කරන්න පුළුවන් කම ශක්තිය තිබෙන්නේ ඒ සිත්වල එහෙම

බලයක් තිබෙන හින්දයි. එතකොට බලන්න දැන් අපි මොකක් හරි දෙයක් කරලා කොච්චර හොඳට හිත හිතා හිත හිතා මෙනෙහි කරන්න පුළුවන් කම තිබෙනවද ප්‍රතිපදාවේ ගමන් කිරීමක් හැටියට. මේ එක ධර්මයක්.

දැන් මෙතැන සාමාන්‍ය කුසල් සිත් වලින් කරපු දෙයයි මහග්ගත භාවයට ගිය ප්‍රථම ධ්‍යානය දුතිය ධ්‍යානය ආදී ධ්‍යාන ස්වභාවයයි දෙකම එක්කාසු වෙලා කියනවා. ඊළඟට තව ඉහළ පැත්තකට හැරිලා කථා කරනවා. ඒ තමයි

- **සෙක්ඛා ගොත්‍රභුං ගරුං කත්වා පච්චවෙක්ඛන්ති**

සෙක්ඛා කියලා කියන්නේ සෝවාන් ආදී මාර්ග ඵල අවබෝධ කරගත් අය. නමුත් මෙතැන ඉස්සෙල්ලාම කියනවා සෝවාන් වූ උත්තමයන් ගැන. මොකක්ද මේ ගොත්‍රභූ කියලා කියන්නේ? ගොත්‍රභූ කියලා කියන්නේ නිවන පැත්තට හැරෙන්නා වූ පළවෙනි සිත. ඒ කියන්නේ යම් කිසි කෙනෙක් සංසාරයේ අනාදිමත් කාලයක් දිව්‍යලෝකයට ගියත් පෘතක්ජනයි බ්‍රහ්මලෝකයට ගියත් පෘතක්ජනයි මනුශ්‍යලෝකයට ගියත් පෘතක්ජනයි. සතර අපායේ ගියත් පෘතක්ජනයි. මේ සක්වලේ පිට සක්වලේ කොහේ හිටියත් පෘතක්ජනයි. පෘතක්ජනයෙක් හැටියට පේළියට පෘතක්ජන සිත පවත්වලා ඉස්සෙල්ලාම පෘතක්ජන භාවයෙන් අයින්වෙලා නිවනක් නිරෝධයක් සැපයක් තිබෙන පැත්තකට පළමුවෙන් හැරී යන්නාවූ සිතට කියනවා **ගෝත්‍රභූ චිත්තය** කියලා. ඒ වාගේම විපස්සනා කරන්නා වූ අවසාන හිතට කියනවා **අනුලෝම චිත්තය** කියලා.

මේ ගෝත්‍රභූ චිත්තය හරි බලවත්. ඊට පස්සේ තමයි මාර්ග සිත පහළ වෙන්නේ. සෝවාන් වෙච්ච එක්කෙනා අනුලෝම ගෝත්‍රභූ මාර්ග ඵල ඔස්සේ නිර්වාණ ධාතුවට සැපත් වෙලා කියලා අපි උපකල්පනය කරනවා මේ සිද්ධියේදී. ඒ සෝවාන් තත්වයට පත්උනාවූ ආර්ය පුද්ගලයා ඒ තත්වයට චිත්ත වීථියක් හරහා ගමන් කරලා ඵලයට පත්වෙලා ඊට පස්සේ එයාට පහළ වෙනවා මාර්ග ඵල අවබෝධ කිරීමේ මානසික ක්‍රියාව තුල ඒ වෙනස් වීම තුල ශාන්ත පැත්තට වෙනස් වී යෑම තුල සිදු වූ සිදුවීම පිළිබඳව ප්‍රත්‍යයවේක්ෂා කරන සිත්. අපි හිතමු මේ සෝවාන් වෙච්ච එක්කෙනා 'මට මොකක් හරි විශේෂයක් අද උනා' කියලා දැනගන්නවා. ඒක හිතට හොරෙන් සිද්ධ වෙන්නේ නෑ. ඒක කිසිම කෙනෙකුගෙන් අහන්න ඕනේ වෙන්නේ නෑ. තමන්ට දැනෙනවා සුභ පැත්තට හිත පෙරලීම. ඒක හොඳට මතකයි. සක්සුදක් සේ හොඳට මතකයි. කෙනෙක් මී පැණි කනවා. මී පැණි කෑවහම එයාට හොඳට දැනෙනවා රස. කටේ ඇතිල්ලිලා තැවරිලා පැතිරිලා මී පැණි වල තිබෙන මී පැණි රස හොඳට දැනෙනවා. හොඳට මතකයි. ආයේ කාගෙන්වත් අහන්න ඕනේ නෑ 'මම මී පැණි කෑවා, ඒක මට රසද, ඒ මම කෑවේ මී පැණිද' කියලා. එක අහන්න ඕනේ නෑ. ඒක හොඳටම තේරෙනවා. ඒක කාගෙන්වත් අහලා තහවරු කරගන්න අවශ්‍ය නෑ. හිතට හොරෙන් මී පැණි කන්න බෑ. එහෙම නම් සිහියකල්පනාව නැති එක්කෙනෙක් වෙන්න ඕනෑ.

මේ නිර්වාණ අවබෝධයත් ඔය වගේ බොහොම සිහිය වැඩිච්ච තැනක්. එතකොට හොඳට මතක තිබෙනවා. සෝවාන් මාර්ග ඵලයට පත් උනාට පස්සේ ඒ ආර්යන් වහන්සේ

ඒ සිද්ධිය මෙනෙහි කරනවා. මෙනෙහි කිරීමේදී එයාට ලොකුවට තේරෙන්නේ ඉස්සර වෙලාම නිවන් පැත්තට හැරී ගිය හිත. ඒකට කියනවා **ගෝත්‍රභූ** සිත කියලා. ගෝත්‍රභූ සිත මෙනෙහි කරනවා. ඒක මෙනෙහි කරන්නේ නිකන් නොවෙයි. ඒක එයාට හරි වටිනා සම්පතක්. ඒවගේම ඒ සිද්ධියේදී වෙච්ච දෙයත් එක්ක එයා මෙනෙහි කරනවා. ඒක එයාගේ ජීවිතියේ සිද්ධ වෙච්ච වෙනසක්. ඒක ශාන්තියක්. මේ ගෝත්‍රභූ සිත එයාට මෙනෙහි වෙන ආකාරය. එහෙම මෙනෙහි කරනකොට එයාට ඥාන සම්ප්‍රයුක්ත සිත් පහළ වෙනවා. ඒවා මෙනෙහි කිරීමේදී භවාංග - භවාංග චලන - භවාංග උපච්ඡේද - මනෝද්වාරාවජ්ජන - ඊට පස්සේ ඥාන සම්ප්‍රයුක්ත කුසල් සිත හත් වතාවක් ජවන් සිත් හැටියට පහළ වෙනවා. මේ ජවන් සිත්වලට පෙනෙන්නේ දැනෙන්නේ අරමුණුවෙන්නේ වැටහෙන්නේ අර ගෝත්‍රභූ සිතයි. ගෝත්‍රභූ සිත ඒක නිසා අධිපති වෙනවා. ආරම්මණ අධිපති ශක්තිය ඒ ගෝත්‍රභූ සිතේ තිබෙනවා. ඒක නිසා ඒ පැත්තට හරවාගෙන තමයි මේ සිතුවිලි ඇතිවෙන්නේ. ඒක නිසා එතැන කියනවා **කුසලො ධම්මො කුසලස්ස ධම්මස්ස අධිපතිපච්චයෙන** පච්චයො කියලා.

ඊළඟට එතැනින් එහාට ගියහම සකෘදාගාමී සහ අනාගාමී ආර්යන් වහන්සේලා මෙනෙහි කරනවා වෙන විදියකට. ඒ දෙදෙනා වහන්සේ

- **සෙක්ඛා වොදානං ගරුං කත්වා පච්චවෙක්ඛන්ති.**

සෝවාන් වෙන අවස්ථාවේදී පරිකර්ම - උපචාර - අනුලෝම - ගෝත්‍රභූ - මාර්ග - ඵල කියලා වෙනස් වෙනස් සිත් වර්ග පේළියට ගලාගෙන යනවා. සෝවාන් වෙන එක්කෙනාට පහළ වෙන්නේ ඉසේල්ලාම ගෝත්‍රභූ සිත. මාර්ග සිතට කලින් මේ සිත පහළ වෙන්නේ. නමුත් සකෘදාගාමී ආර්යන්වහන්සේට ගෝත්‍රභූ සිතක් පහළ වෙන්නේ නෑ. අනාගාමීන් වහන්සේටත් ගෝත්‍රභූ සිත් පහළ වෙන්නේ නෑ. ඒකට හේතුව ඊට කලින් සෝවාන් වෙන අවස්ථාවේදී ගෝත්‍රභූ සිත පහළ වෙලා තිබෙන නිසා. සකෘදාගාමී සහ අනාගාමීන් වහන්සේලාට පහළ වෙන්නේ ගෝත්‍රභූ සිත වෙනුවට **වෝදාන සිත.** ඒ කියන්නේ පළමුවෙන් දැකපු නිවන තව තහවරු කරගැනීම වශයෙන් ඒ පැත්තට හැරෙන සිත. ඒකට කියනවා **වෝදාන සිත** කියලා. සකෘදාගාමී අනාගාමී උතුමන් වහන්සේලා සකෘදගාමි උනාට පස්සේ අනාගාමී උනාට පස්සේ සෝවාන් උනාට වඩා වැඩි ආලෝකයකින් වැඩි බලයකින් නිවන සප්ර්ශ කළ නිසා **වෝදාන සිත** අරමුණක් හැටියට මෙනෙහි කරනවා. එතැනදී වෙන්නෙත් **කුසලො ධම්මො කුසලස්ස ධම්මස්ස අධිපතිපච්චයෙන පච්චයො.**

සකෘදාගාමී අනාගාමීන් වහන්සේලා දෙනම මෙනෙහි කරන්නේ අතීතයට ගියාවූ සිතක්. ඒ කියන්නේ අතීතයේ තමන්ට සිද්ධ උනා වූ මාර්ග ඵල අවබෝධයේදී ඇති වෙච්ච වෙනස් කම. එතැනදී එයාට වෝදාන සිත ආරම්මණ අධිපති ස්වභාවයෙන් ඉදිරිපත් වෙනවා. ඒ පැත්තට හැරිලා තමයි මේ සිත වැඩ කරන්නේ. දැන් බලන්න කුසල ධර්මයක් කුසල ධර්මයක් පැත්තට හැරිලා ක්‍රියාත්මක වෙන තාලේ.

ඊළ තව එකක් තිබෙනවා.

- **සෙක්ඛා මග්ගා වුට්ඨහිත්වා මග්ගං ගරුං කත්වා පච්චවෙක්ඛන්ති.**

සෝවාන් වෙච්ච සකෘදාගාමී වෙච්ච අනාගාමී වෙච්ච ආර්යන් වහන්සේලා තම තමන් පැමිණි මාර්ගයෙන් නැගී ඒ මාර්ග අස්ථාවේ මේ විදියට කෙලෙස් නැසුනා කියලා ඒ මාර්ග සිතේ තිබෙන්නාවූ ආනුභාවය ශක්තිය ගැන මෙනෙහි කරනවා. එතකොට සිද්ධ වෙන්නෙත් **කුසලො ධම්මො කුසලස්ස ධම්මස්ස අධිපතිපච්චයෙන** පච්චයො. ඒකට ගරු කිරීම් වශයෙන් මාර්ග සිත බලවත් වෙනවා. මේ කිව්වේ පෘතක්ජන භාවයේ ඉඳලා ආර්ය තත්වයට පත්වෙනකොට සිත් පෙරළිය වෙච්ච තැන හිතන එක. මේ හැම තැනම කියාගෙන කියාගෙන ආවේ **ආරම්මණ අධිපති භාවය.**

මේක අහගෙන ඉන්න අපේ පින්වතුන් නැවත පොඩ්ඩක් ආපස්සට යන්න ඕනෑ. අපි මේ මාතෘකාව පටන් ගන්න කොට කිව්වා අධිපති ස්වභාවය විදි දෙහෙකට ක්‍රියාත්මක වෙනවා කියලා. එකක් තමයි ආරම්මණ ස්වභාවයෙන් අධිපති වෙනවා. අනිත් එක තමයි සහජාත ස්වභාවයෙන් අධිපති වෙනවා. දැන් මේ වෙලාව වෙනකොට පෘතක්ජන සිතක කුසල් සිතක් සේක සිතක කුසල් සිතක් සෝවාන් සකෘදාගාමී ආනගාමී සිත්වල කුසල් සිත් පහළ වෙන විදිය කියලා දුන්නා. ඒකෙ මාතෘකාව **කුසලො ධම්මො කුසලස්ස ධම්මස්ස අධිපතිපච්චයෙන පච්චයො.** මෙහිදී කිව්වේ සෝවාන් සකෘදාගාමී අනාගමීන් වහන්සේලා ගැන පමණයි.

දැන් අපි බලමු **සහජාත ස්වභාවය**. ඒක තිබෙන්නේ මෙහෙමයි.

- **කුසලාධිපති සම්පයුත්තකානං ඛන්ධානං අධිපතිපච්චයෙන පච්චයො.**

මෙතැන කියන්නේ අධිපති කථාව. මෙතැන තිබෙනවා හිතන්න තැනක්. අපි ඉස්සරවෙලා කරපු පිංකමක් ගැන දැන් ඒ පැත්තට හැරිලා හිතනවා. පිංකම අතීතයේ කරලා ඉවරයි. මේ වේලාවේ අපි හිතනකොට මෙනෙහි කරනකොට ප්‍රත්‍යවේක්ෂා කරනකොට අපේ හිතේ පහළ වෙනවා අතීතය පැත්තට හැරිලා කුසල ජවන් සිත් ටිකක්. ඒ කුසල ජවන් සිත් කියලා කියන්නේ තවත් චෛතසික ධර්ම එක්ක පහළ වෙන ධර්ම පොකුරක්. ධර්ම කට්ටලයක්. එතකොට සිත සහ චෛතසික ඔක්කොම එකටයි උපදින්නේ එකටයි පවතින්නේ එකටයි වැසෙන්නේ. මෙතැන ඔක්කොම එක රංචුවට එක පොදියට අතීතය ගැන හිතාගෙන අතීතයට නැමීගෙන ඒ කරපු පිංකම දිහා බලාගෙන ඒ පැත්ත මෙනෙහි කරගෙන පහළ වෙනවා. මෙහෙම පහළ වෙනකොට මෙතැන ඉන්නාවූ ධර්ම මණ්ඩියෙත් ඉන්නවා අධිපති වැඩ කරන කට්ටිය. ඒකට කියනවා **කුසලාධිපති** කියලා. ඒ කියන්නේ ඒ වේලාවට ධර්මයක් අධිපති වෙනවා. එහෙම අධිපති වෙලා එතැන ඉන්න අනිත් අයට අධිපතිකම් පානවා. අනිත් සහජාත ධර්මයන්ට අධිපති වෙනවා. ඒකට කියනවා එකට උපදින්නා වූ ධර්ම අතර කුසල වශයෙන් කියන අධිපති ධර්මය අනිත් නාම ධර්මයන්ට එකට උපන්නා වූ අයගේ හැටියට අධිපති ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙනවා කියලා. එහෙම පුළුවන් කමක් තිබෙනවා. එතැනදී තිබෙන්නේ අධිපති භාවය කථා කරන්න ධර්මතා හතරක් විතරයි. ඒ තමයි ‘ඡන්ද’ ‘චිත්ත’ ‘විරිය’ ‘විමංසා’. මේ කියන්නා වූ හතර දෙනා තමයි මෙතැන බලවත්.

මෙහෙම  මෙනෙහි කරනකොට විශේෂයෙන්ම බලවත් වෙන්නේ  ප්‍රඥාව. අනිත් ඒවා ඒකට නතුවෙලා කටයුතු කරනවා. ඔන්න අධිපති වෙච්ච තාලේ.

එතකොට අර සිත් අට ධර්ම හැටියට බලපවත්වනවා. ඒවත් එකක් වැඩ කරන්නා වූ චෛතසික ධර්ම  තිබෙනවා. ඒකෙ තිබෙනවා **ප්‍රත්‍යය ධර්ම** සහ **ප්‍රත්‍යය උප්පන්න** ධර්ම. බලවත් එක්කෙනා 'සිත වශයෙන්' 'ඡන්දය වශයෙන්' 'විරිය වශයෙන්' 'විමංසා වශයෙන්' අධිපති කම්  කරන්න පුළුවන්  බලය හයිය වැඩිපුර  තිබෙන්නා වූ ධර්ම. අනිත් ඒවා ඒ ධර්ම වලට යටත් වෙලා ඒ සැර  ලබාගෙන  පවතින ධර්ම. කුසල ධර්මය කුසල ධර්මයන්ට අධිපති  භාවයෙන්  ප්‍රත්‍යය උනා කියලා. මම මේ දක්වාම කිව්වේ **කුසලො ධම්මො කුසලස්ස ධම්මස්ස අධිපතිපච්චයෙන පච්චයො** කියන එක **ආරම්මණ වශයෙන්** සහ **සහජාත වශයෙන්** මේ වෙලාවට තරමක විස්තරයක් මේ කළේ. මේ එක වීථි ධර්මයක්.

හොඳට මතක තබා ගන්න අපි  ආර්යන් වහන්සේලා තුන්දෙනෙක් ගැන කිව්වා රහතන්වහන්සේ ගැන කිව්වේ නෑ. ඒකට  හේතුව  අපි බලමු ඉස්සරහෙදි.

අපි වෙන වීථියක් බලමු. ඒකෙ මාතෘකාව මෙහෙමයි.

<u>**2වෙනි වීථිය**</u>

**කුසලො ධම්මො අකුසලස්ස ධම්මස්ස අධිපතිපච්චයෙන පච්චයො** - **ආරම්මණාධිපති =** කුසල ධර්මය අකුසල ධර්මයකට අධිපති භාවයෙන් ප්‍රධානත්වයෙන් ප්‍රත්‍යය වෙනවා - ආරම්මණ අධිපති. එහෙමයි කියන්නේ.

හැබැයි කුසල ධර්මයක් තමයි අකුසල ධර්මයකට අධිපති වෙන්නේ. අපි බලමු කොහොමද ඕක වෙන්නේ කියලා.

- **දානං දත්වා සීලං සමාදියිත්වා උපොසථකම්මං කත්වා, තං ගරුං කත්වා අස්සාදෙති අභිනන්දති**

දානයක් දීලා පිංකමක් කරලා සීල සමාදානයක් වෙලා  පෙහෙවස් සමාදන් වෙලා ඒ කරපු දේ හොඳයි  යහපත්  කියලා ලෝභ වශයෙන් කෙලෙස් වශයෙන් ආස්වාදනය කරනවා. හිතනවා. මෙනෙහි කරනවා. ඒකෙ ඇලෙනවා. ආන්න එතකොට **තං ගරුං කත්වා රාගො උප්පජ්ජති දිට්ඨි උප්පජ්ජති**. ඇලීමයි  දෘෂ්ඨියයි  දෙක පහළ වෙනවා. මේ ඇලීමයි දෘෂ්ඨියයි කියලා කියන්නේ  හොඳ සිත් නොවෙයි. මේවා නරකයි. කුසලයට ඇලෙන්න හොඳ නෑ. කුසලයට දෘෂ්ඨිගත වෙන්න හොඳ නෑ. මේවා අකුසල්. මේවා අකුසල් උනත් මේ ඇලීමට දෘෂ්ඨිගත වීමට රාග සිතුවිලි පහළ වීමට අරමුණක්  හැටියට  ඉදිරිපත් වෙන්නේ බලවත් වෙන්නේ මීට  කලින් කරලා තිබෙන ඒ දානයයි.  නැත්නම් ඒ සමාදානයයි. උපෝසථ කර්මයයි. ඒ පැත්තට හැරිලා තමයි ලෝභ කරන්නේ. ඒ පැත්තට හැරිලා තමයි රාග සිත් පහළ කරන්නේ. ඒ පැත්තට  හැරිලා  තමයි දෘෂ්ඨිය ඇතිකරගන්නේ.  ඒ නිසා මෙතැන පහළ වෙන්නා වූ ඒ චේතනාවන්ට  පරණ දේවල්  ආරම්මණ අධිපති භාවයෙන්  ඉදිරිපත් වෙනවා.  බලවත් වෙනවා.  ඔන්න අකුසලේට යන තාලේ.

තවත් එකක් තමයි ලෝභ කරනකොට පහළ වෙන ලෝභ සිත් 8 ක් තිබෙනවා. ඒ අටෙන් තමයි ඕක කෙරෙන්නේ.

- **දිට්ඨි උප්පජ්ජති, පුබ්බෙ සුචිණ්ණානි ගරුං කත්වා අස්සාදෙති අභිනන්දති**

මීට කලින් තමන් දෙමව්පියන්ට කළ ගරුකිරීම් සත්කාර සම්මාන කිරීම් වැඳුම් පිදුම් කිරීම් ඉස්කෝල හදපු දේවල් එක එක අසරණ තැන්වලට ගිහිල්ලා පිහිට වෙච්ච වැනි හොඳ දේවල්, දීර්ඝ කාලයක් බල්ලන්ට කපුටන්ට කෑම දීපු දේවල් = **පුබ්බෙ සුචිණ්ණානි**. 'මම මේ දේවල් මේ විදියට කළා' කියලා ඒ පැත්තට හැරිලා අර දෘෂ්ඨියයි රාගයයි දෙක සන්තෝස වශයෙන් විඳීම් වශයන් පහළ වෙනවා = **තං ගරුං කත්වා රාගො උප්පජ්ජති, දිට්ඨි උප්පජ්ජති**. එතකොට පහළ වෙන්නා වූ රාගයටයි දෘෂ්ඨියටයි අර පෙර කරපු හොඳ ටික උදව්වක් වෙනවා අධිපති භාවයෙන්. ඒවාට පුළුවන් කම තිබෙනවා අකුසල් උනත් ඒ පැත්තට නතු කරගන්න.

- **ඣානා වුට්ඨහිත්වා ඣානං ගරුං කත්වා අස්සාදෙති අභිනන්දති; තං ගරුං කත්වා රාගො උප්පජ්ජති, දිට්ඨි උප්පජ්ජති**

ධ්‍යානයකට සමවැදිලා ඒ ධ්‍යානයෙන් නැගිටලා ආස්වාදනය කරලා අභිනන්දනය කරලා සතුටින් එක ගරු කරලා 'මට ධ්‍යාන තිබෙනවා, ඒක හොඳයි' කියළා රාගය ඇති වෙනවා, මමත්වය ඇතිවෙනවා. එතකොට කෙලෙස් ඇතිවෙනවා = **රාගො උප්පජ්ජති, දිට්ඨි උප්පජ්ජති**. එතකොටත් ඇතිවෙන්නේ ආරම්මණ අධිපති ස්වභාවය. ධ්‍යානයක් පහළ උනහම ධ්‍යානය නැතිවෙන්නත් හේතු වෙනවා මේ ඇලීම සහ දෘෂ්ඨිය. ධ්‍යානයත් ආරම්මණ අධිපති ප්‍රත්‍යයෙන් ඉදිරිපත්වෙන හැටි තමයි මේ වීථියෙන් කියන්නේ.

මෙතැන කරුණු තුනක් කියවෙනවා. කුසල ධර්මයක් අකුසල ධර්මයකට අධිපති ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙන ආකාරය කියන කොට අවස්ථා තුනකට කියනවා. එකක් තමයි දානමය අවස්ථාව. එය කාමාවචරයි. සීලමය උපෝසථ අවස්ථාව කාමවචරයි. අනිත් එක තමයි කරපු හොඳ දේවල්. අනිත් එක ධ්‍යාන. ධ්‍යාන කියලා කිව්වහම රූපාවචර සහ අරූපාවචර ධ්‍යාන ඔක්කොම මේකට එක්කාසු කරගන්නවා.

මම කිව්වා කුසල වීථි දෙකක් අධිපති කෘත්‍යය යටතේ. අධිපති භාවය යටතේ කථා කරන්න සුදුසු ඒවාගේම දැනගතයුතු චිත්ත වීථි දෙකක් පිළිබඳව මම පින්වතුන්ට මේ වේලාවේ මතක් කළා. තව තිබෙනවා මේකේ ඉස්සරහට කියන්න. ඒක තිබෙන්නේ අව්‍යාකෘත ධර්ම සම්බන්ධයෙන්. අපි ප්‍රත්‍යය ධර්මයන් පිළිබඳව කථා කරගෙන යනඑක දැන් කරන්නේ. අද පැයක පමණ ප්‍රමාණයකට තමයි මගේ ශක්තිය තිබෙන්නේ. මට හරි කරුණාවක් ඇති උනා මේ පින්වතුන් කෙරෙහි මේ වෙසක් සමයෙහි මේ කරගෙන ආපු වැඩ සටහනේ එක ස්ථානයකට එන්න. ඉතින් මම ඒ බලපොරොත්තුවෙන් හොඳ හැඟීමකින් තමයි ආවේ. ඉතින් ලොව්තුරා තථාගත බුදුරාජාණන්වහන්සේ උන්වහන්සේගේ හිත උන්වහන්සේ නෙත් දෙක පියා ගත්තා හෝ පියාගත්තේ නැතුව හෝ විහාරයේ ඇතුලේ වැඩ හිටියා හෝ පිට වැඩ හිටියා හෝ උන්වහන්සේට යම් කිසි ධර්ම ස්වභාවයකට හිත යොදපු ගමන් තථාගත බුදුරාජාණන්වහන්සේට කැළඹිල්ලක්

නැතුව බාධකයක් නැතුව ඒ ධර්මය හොඳට පේනවා වැටහෙනවා පෙනී යනවා. හොඳට පේනවා. අතේ තිබෙන අතැඹුලක් වගේ කියලයි කියන්නේ. නෙල්ලි ගෙඩියක් වගේ හොඳට පේනවා. ඊටත් වඩා විසිතුරුව පේනවා. අපි මේ උදාහරණ උපමා ගලපා ගලපා වචන සමූහයක් එක්කාසු කරගෙන පේළි පේළි අරගෙන මේ කථා කරපු දේ තථාගතයන් වහන්සේගේ සිතට නිකං හැරෙව් මාත්‍රය පමණයි. අපේ ලොව්තුරා බුදුරාජාණන්වහන්සේගේ සිත ඥාන ශක්තිය ඔන්න ඔය විදියයි. උන්වහන්සේගේ සිතේ භයක් කිසිම දෙයක් නෑ. උන්වහන්සේගේ සන්තානයේ පසුතැවිලි කිසිම දෙයක් නෑ. බලාපොරොත්තු කිසිම දෙයක් නෑ. ඇලීම් කිසිම දෙයක් නෑ. ඥානයෙන් පිරිච්ච කරුණාවෙන් තෙත්වෙච්ච දයාව මෛත්‍රී ගුණ සත්වයන්ට හරවලා තිබෙන මහා පුදුම උත්තමයන් වහන්සේ නමක්. ඒ තථාගත බුදුරාජාණන්වහන්සේගේ ගුණ හිතන කියන වඳින පුදන සමයක් තමයි මේ වෙසක් කාලය. උන්වහන්සේගේ අන්තිම ජන්මය හිතන සමයක් මේ. සම්මා සම්බුද්ධත්වයේ උතුම් බව හිතන කාලයක් මේ. උන්වහන්සේ අවසාන චුති චිත්තය ඇතිකරගෙන උන්වහන්සේ නිර්වාණයට වැඩම කරපු පිවිසෙච්ච සමය හිතන කාලයක් මේ. ඉතින් මේ කාලයේ අපි ලොව්තුරා බුදුරජාණන්වහන්සේගේ ඒ චිත්තය ස්පර්ශ කරපු උන්වහන්සේගේ ඥානය සප්ර්ශ කරපු අනන්ත අපරිමාණ නය ක්‍රමයකින් සමන්නාගත වූ ධර්ම කොට්ඨාසය කලාමැදිරියන්ටත් වඩා ඉතා පුංචි වශයෙන් මේ ධර්මටික අපි මෙනෙහි කරන්න අද මේ කාලය වෙන් කර ගත්තා.

මේ ධර්මය කථා කිරීම මේ ධර්මය මෙනෙහි කිරීම මේ ධර්මය හිතීම ඒ කාන්තයෙන්ම අපි සැම දෙනාටම ප්‍රතිපත්තියක් වේවා! ඒවාගේම ආර්යන් වහන්සේලා හිතපු තැනක මේ ධර්මය මෙනෙහි කරන්න අපිට පුදුම වාසනාවක් තිබෙනවා. ඒක නිසා මෙය ඒකාන්තයෙන්ම තථාගත බුදුරාජාණන්වහන්සේට ප්‍රතිපත්ති පූජාවක් වේවා! කියලා අපි නමස්කාර පූර්වකව පූජා කරමු. මේ පින්වත් සැම දෙනාටමත් මේ දහම් කරුණු ඉතාමත් හොඳට තේරුම් අරගෙන වටහාගෙන ධර්ම මාර්ගයේ ගමන්කොට කෙළවර අමාමහ නිවනින් සැනසෙන්න ලැබේවා! නිර්වාණ අවබෝධය පිණිස මේ කුසල් මේ පිං හේතු වසනා වේවා! කියලා මෛත්‍රීයෙන් ආශිර්වාද කරනවා. ප්‍රාර්ථනා කරනවා. සැමදෙනාටම තෙරුවන් සරණයි!

සාධූ! සාධූ! සාධූ!

<u>ලලිත් දළුවත්ත මහත්මයා</u> - හොඳයි ස්වාමීන්වහන්ස අදත් මේ සම්බන්ධ වූ සියලුම කල්‍යාණ මිතුරු මිතුරියන් වෙනුවෙනුත් පූජ්‍යපාද ජිනාලංකාර ස්වාමීන්වහන්සේට නැවත වතාවක් නමස්කාර කරමින් උන්වහන්සේ ප්‍රාර්ථනා කරන බෝධියකින් චතුරාර්ය සත්‍යය ධර්මය පූර්ණ වශයෙන්ම අවබෝධ කරගැනීමට මේ ධර්ම දානමය කුසලය හේතුවක් වේවා කියලා ප්‍රාර්ථනා කරමින් ස්වාමීන්වහන්වහන්සේට යොමුවෙනවා සාකච්ඡාව නිමා කිරීමට. තෙරුවන් සරණයි!

<u>ස්වාමීන්වහන්සේ</u> - හොඳයි පින්වත්නි අවසාන වශයෙන් ආශිර්වාද කරනවා. පින්වත් අපේ ලලිත් දළුවත්ත මහත්මයා කල්‍යාණ මිත්‍රත්වයෙන් ඉදිරිපත් වෙලා මේ සත්කාරය

බොහොම ඕනෑ කමින් කරගෙන යනවා කල්‍යාණ මිත්‍ර මණ්ඩලය එක්කාසු කරගෙන. ඒවගේම අපේ ජයන්ත මහත්මයාටත් අසාගෙන සිටි සැම දෙනාටමත් අපි නිරෝගී භාවය ප්‍රාර්ථනා කරනවා. ඒවාගේම නිදුක් භාවය ප්‍රාර්ථනා කරනවා. විශේෂයෙන්ම ඔය තිබෙන්නා වූ අපල උපද්‍රව අතීත අකුසල කර්ම බලවේග යටපත් වෙලා කුසල කර්ම බලවේග ශක්තිය මතුවෙලා යහපත් ධර්මයෙන් පිරිච්ච උතුම් ජීවිතියක් හැමදෙනාටම ලැබේවා. අපේ ලලිත් මහත්මයා ඇතුළුව හැම දෙනාටම මේ භයංකර දුක් ඇති සංසාර කාන්තාරයෙන් එතෙර වෙලා නිවනින් සැනසෙන්න මේ උතුම් අතිශය සූක්ෂම ධර්ම පරාසය ගැන කථා කිරීමේ කුසලය හේතු උපනිශ්‍රය වේවා! අපි සැම දෙනාටම සසර දුකෙන් මිදී නිවනින් සැනසෙන්න ලැබේවා! කියලා මම අවසාන කිරීම් වශයෙන් ප්‍රාර්ථනා කරනවා. ආශීර්වාද කරනවා. සැමදෙනාටම රත්නත්‍රයේ සරණයි!

සාධූ! සාධූ! සාධූ!

සීලවන්තං ගුණවන්තං - පුඤ්ඤක්ඛෙත්තං අනුත්තරං
දුල්ලබෙන මයා ලද්ධං - පස්සිතුං වන්දිතුං වරං
සාරිපුත්තාදි ථේරානං - ආගතං පටිපාටියා
සද්ධා සීලං දයා වාසං - බුද්ධ පුත්තං නමා මහං



ඉහත සඳහන් ධර්ම දේශනාව

අති පූජ්‍ය හන්තේ ජිනාලංකාර ස්වාමීන්වහන්සේ විසින් දේශිතයි